සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය -- 2019

## 10 ශ්‍රේණිය
## සිංහල සාහිත්‍ය රසාස්වාදය

**නම/විභාග අංකය :-- ......................................................................................... කාලය : පැය 03 යි.**

- **I කොටසෙහි 1, 2 ප්‍රශ්නවලටත්, II කොටසෙහි 3 වැනි ප්‍රශ්නයටත්, III කොටසෙහි 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.**

### I කොටස

(1) (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) ''මහරජ, මාගේ යෙහෙළණියෝ මපුතණුවන්ට නිස්සහ.''
(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(ආ) 'යෙහෙළණියෝ' යනුවෙන් මෙහි සඳහන් වන්නේ කවුරුන් පිළිබඳව ද?

(ii) 'නෑ අපි දන්නේ මේ ආවැන් පස්සේ, කාලෙකින් එන්ඩ බැරිවුණු හින්ද ඇවිත් යන්ඩ ආවා.''
(අ) මෙම ප්‍රකාශය කාගේ ද?
(ආ) ඉහත උද්ධෘතය උපුටා ගත් කෘතියේ කතුවරයා නම් කරන්න.

(iii) ''අයියේ, කුඩුව බලන්ට යමු.''
(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?
(ආ) මෙම උද්ධෘතය උපුටා ගත් කෘතිය කුමක් ද?

(iv) රුදුරු ගිනි කඳක් ගත් සඳෙහි වනතුරු
**මිතුරු** වේ ය දිගතින් හමන මඳ මරු
**මිතුරු** නැසීමට එම වෙයි පස මිතුරු
මිතුරු නෑ කෙනෙක් නිවතුන් හට කවුරු
(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.
(ආ) පද්‍යයේ මුල් දෙපදයේ අර්ථය ලියන්න.

(v) දොඩම් කපාලා ඇඹුල් තනාලා
නාන්ඩ යන හැටි බලන් කලූ
සේලේ ඇඳලා නෙරිය තියාලා
මිදුලේ සක්මන් කරයි කලූ
(අ) මෙම පද්‍යයේ ඉතිරි දෙපදය සම්පූර්ණ කරන්න.
(ආ) මෙම කවි අයත් වන්නේ කුමන ජනකවි ප්‍රභේදයට ද? (ලකුණු 4 × 5 = 20යි)

(2) පහත සඳහන් පැදි පෙළ කියවා, දී ඇති ප්‍රකාශ උපයෝගී කොට ගෙන **රසාස්වාදයක්** ලියන්න.

ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ
දුක්දෙන අලි ඇතුන් පන්නා හරින්නේ
රැක්මෙන දෙවියනේ වෙල බත් බුදින්නේ
දුප්පත්කම නිසයි මම පැල් රකින්නේ

බෝඹු ඉදල දලු ලා දෝ නො ලා දෝ
කෙකටිය මලේ වක යා දෝ නො යා දෝ
කැලණි ගඟේ ඕරු යා දෝ නො යා දෝ
කළුගෙ නගා මෙහි ඒ දෝ නො ඒ දෝ

කන්ද උඩින් එන කිකිළිය ගෝමරියේ
නළල් වටින් එන දාඩිය මුතු කැටියේ
අත පාමුදු පය පාමුදු වයිරොඩියේ
මට පිටුපා ගෙට යනව ද සුරතලියේ

අල්ලාගෙන නෙරිය අතකින් කිම් ද නගෝ
වසාගෙන දෙතන අතකින් කිම් ද නගෝ
හිමියෙක් නැති ගමන් තනි මඟ කිම් ද නගෝ
අම්බලමේ ඉඳලා අපි යම් ද නගෝ

(i) මෙම පැදි පෙළ සඳහා පාදක වී ඇති අත්දැකීම් දෙකක්
(ii) පද්‍ය පන්තිය සඳහා කවියා යොදා ගත් බස්වහර
(iii) ගැමි තරුණයෙකුගේ සිතුවිලි
(iv) සංයමයෙන් යුතුව අදහස් ප්‍රකාශනය
(v) ජනකවියෙන් හෙළි වන ගැමි ජීවිතයේ දුෂ්කරතා (ලකුණු 25)

## II **කොටස**

- පහත සඳහන් ගද්‍ය - පද්‍ය කොටස් දෙකෙන් **එක කොටසකට පමණක්** පිළිතුරු සපයන්න.

(3) බෝධිසත්ත්වයෝ ද පසේ බුදුන්වහන්සේගේ පාත්‍රයට කැවුම් කොටස පිළිගන්වා ''ස්වාමිනී, ඉදින් යොදුන් සියයක උන්නත් මුන් මාගේ බලයෙන් ගෙන්වා ගෙන මට පාදපරිචාරිකා කරන්ට සමර්ථ වෙම්ව''යි ප්‍රාර්ථනා කළෝ ය.

කිපී ගොස් පසේ බුදුන්ගේ පාත්‍රයේ තුබූ කැවුම් හැර ගත් හෙයින් මුඛය විසුළු ව ගියේ ය. මේ තෙම මොවුන්ගේ පූර්ව ක්‍රියා වන්නේ ය. බෝධි සත්ත්වයෝ ප්‍රභාවතීන් ගිය නියාව අසා ශෝකයට පැමිණියහ. අවශේෂ නාටක ස්ත්‍රීහු නොයෙක් ප්‍රකාරයෙන් සිත් නළවන්නාහු පොලඹා ගත නුහුණුවහ.

ප්‍රභාවතීන් නැති රජගෙය කුසරජ්ජුරුවන්ට හිස් වූවාක් මෙන් වැටහෙන්නේ ය. මෙලෙසින් රාත්‍රියෙහි බොහෝ දුක් විඳ අලුයම නැඟී සිට සාගල නුවරට ගොස් ප්‍රභාවතී දේවී කැඳවා ගෙන එම් කියා මා එන තෙක් රාජ්‍යය පියාණන් වහන්සේට වේවායි මලණුවන්ට වේවයි පාවා දී ලීම් නම් නැවත ඇරගන්ම ආයාස වේ දැයි සිතා මෑණියන් සීලවතී දේවීන් සමීපයට ගොස් ''මෑණියන් වහන්ස ධන ධාන්‍යාදීන් හරිත වූ ඇත්ඇණි ඇස්ඇණි රියබලයයි සිව්රඟ සෙනඟින් යුක්ත වූ පංචකකුධභාණ්ඩයන් ඇති සියලු උපභෝග වස්තුවෙන් සමෘද්ධ වූ මේ රාජ්‍යය ප්‍රභාවතී කැඳවා ගෙන තෙක් පාවා ගත මැනවැ''යි මෑණියන්ට කියා අවසර ඉල්වූහ.

(i) මෙම පාඨයෙහි සඳහන් ආකාරයට පසේ බුදුන් වහන්සේට කැවුම් කොටස පිළිගන්වා බෝධි සත්ත්වයන් ප්‍රාර්ථනා කළේ කුමක් ද? (ලකුණු 05)
(ii) බෝධිසත්ත්වයන්ගේ මුඛය විසුළුව යාමට හේතු වූයේ කුමක් ද? (ලකුණු 05)

(iii) පබාවතී නැති සොවින් තැවුණු කුස කුමරු ඒ සඳහා කළේ කුමක් ද? (ලකුණු 05)

(iv) පබාවතී කැඳවා ගෙන එන තෙක් තම රාජ්‍යය පවරා දීම පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ලකුණු 25යි)

**නැතහොත්**

නැ ගෙ ත ත්    අවර ගිරගින් දිනකර    මඬල
සැ ලෙ ත ත්    සුනෙර පවනින් සෙදෙතත්    අනල
පි පෙ ත ත්    ගිරි මුඳුන හෙල් මැලි    පියුමු'පුල
බොරුනැත්    තෙම ය මහතුන් පැවසූ    තෙපුල

කොතෙක්    වෙහෙස ලදුවත් සුදනෝ    පවර
උදක්    ලොව සතුන් සිත දුක් කෙරෙති    දුර
පසක්    රාහු මුව පත් වෙමිනි බිය    කර
අනික්    පසින් ලොව හෙළි කෙරෙය හිම    කර

පි න් ම ද    පුතුන් සියයක් ලදුවත්    නිසරු
ගුණ නැණ    බෙලන් යුතු පුතුම ය ඉතා    ගරු
එක පුන්    සඳින් දුරුවෙයි ලොව ගන    අඳුරු
නෙක තරු    රැසින් එලෙසට නො ම වේ ය    දුරු

විපුල    ගුණැති මහතුන් හට පත්    විපත
නිසල    නැණින් යුතු උතුමෝ ම    දුරලත
කලල    ගිලුණු මත වරණිඳු ගොඩ    ගනුත
තුමුල    බලැති ගිජිඳකු මිස අන්    කෙවත

කුලුණු    ගුණින් යුතු උතුමෝ සිත    මහරු
දුදන    බසින් නො යෙදෙයි කරනට    නපුරු
නව    රුවනින් පිරි මහ සමුදුර    ගැඹුරු
තණ    සුළකින් උණු කළ හැකි වෙති    කවුරු

දියනෙත    උදාවත සිය කිරණින්    මහරු
මෙදියත    දිවා බිහි දුරු වෙයි ගන    අඳුරු
සිරිමත    රජ තුමකු දුටු පමණින්    මහරු
ඇතුළත    පිටත දිව රූ හැරෙය    දුක'ඳුරු

(i) මෙම පද්‍ය පන්තිය නිර්මාණයේ දී කවියාගේ අපේක්ෂාව වූයේ කුමක් ද? (ලකුණු 05)

(ii) 'මහත්මයන් කී වචනයෙහි නම් බොරුවක් නැත්තේ ම ය' යන්න සනාථ කිරීම සඳහා කවියා දැක්වූ නිදසුන් **දෙකක්** දක්වන්න. (ලකුණු 05)

(iii) ඉතා උසස් වන්නේ කුමන දරුවකු දැයි මෙහි සඳහන් වේ ද? (ලකුණු 05)

(iv) ඉහත පද්‍යයන් ඇසුරින් කවියා කිනම් උපදේශයන් සමාජයට ලබාදීමට උත්සාහ කොට ඇත් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ලකුණු 25)

## III කොටස

**මෙම කොටසෙන් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

(පිළිතුර වචන 150ට නො අඩු විය යුතු ය.)

(4) රසවිඳින්නා තුළ අපූර්ව චිත්ත රූප මැවීමට කුස ජාතකකතාකරුවා තුළ වූ සමත්කම කුස ජාතකයෙන් නිදසුන් තුනක්වත් දක්වමින් විමසන්න. (ලකුණු 15)

(5) ප්‍රස්තුතයට උචිත පරිදි කථකයාගේ චරිතය හැසිරවීමෙහිලා වෙසක් පහන කෙටිකතාකරුවා පෑ කුසලතාව නිදසුන් තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(6) මිනිසුන් තුළ පවත්නා දුබලතා පෙන්වා දී ඒවා නිවැරදි කිරීමට සුභාෂිත කවියා දැරූ උත්සාහය නියමිත කවි තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(7) කලාත්මක නවකතාවක ලක්ෂණ, තුංමංහන්දිය නවකතාවෙන් කොතෙක් දුරට ඉස්මතු වන්නේ දැයි විමසන්න.

(ලකුණු 15)

(ලකුණු 15 × 2 = 30යි)

**Answer**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - - 2019

## 10 ශ්‍රේණිය
## සිංහල සාහිත්‍ය රසාස්වාදය - පිළිතුරු පත්‍රය

## I කොටස

(1) (i) (අ) සීලවතී බිසව
(ආ) පබාවතී කුමරිය
(ii) (අ) සිරිසේනගේ චිත්තපත්තර බාප්පා
(ආ) මහගම සේකර
(iii) (අ) වෙසක් පහන කෙටිකතාවේ සඳහන් නංගී
(ආ) දුප්පතුන් නැති ලෝකය
(iv) (අ) මිතුරු - යහළු
මිතුරු - පහන
(ආ) වනාන්තරයෙහි රෞද්‍ර වූ ගිනි කඳක් හට ගත් විට දිශා කෙළවරින් හමන්නා වූ මඳ සුළඟ ඒ ගින්න සමඟ මිත්‍ර වේ.
(v) (අ) දහසක් දීලා වළලු තනාලා දෑතේ අතල බලයි — කලූ
දුනුකේ මල සේ උළුගෙයි ඇඳපිට ඔළිඳ කෙළින සැටි බලන් — කලූ (ලකුණු 4 x 5 = 20)
(ආ) ඔළිඳ කවි

(2) (i) පැල් රැකීමේ දී හේන් ගොවියා විඳින කටුක අත්දැකීම්. ගැමි තරුණයක පිළිබඳ ව තරුණියකුගේ සිතේ ඇති වූ සිතුවිලි
(ii) භාෂාව සරලය
උදා : දුක් දෙන අලි අතුන් පන්නා — හරින්නේ
කළුගෙ නගා මෙහි ඒ දෝ නො — ඒ දෝ

ආදී උචිත නිදසුන්
සංවාදශීලි ය.
උදා :මට පිටු පා ගෙට යනව ද — සුරතලියේ
අල්ලා ගෙන නෙරිය අතකින් කිම් ද — නගෝ

ව්‍යංගාර්ථවත් ය.
උදා :අල්ලා ගෙන නෙරිය අතකින් කිම් ද — නගෝ
වසාගෙන දෙතන අතකින් කිම් ද — නගෝ

අනුප්‍රාසවත් ය
බෝඹු ඉදල දල් ලා දෝ — නො ලා දෝ
කෙකටිය මලේ වක යා දෝ — නො යා දෝ

(iii) අවිවාහක තරුණයකුගේ සිතුවිලි හා අපේක්ෂා බොහෝ පද්‍යවලින් ධ්වනිත වේ.
(iv) සංයමයෙන් යුක්තව අදහස් ප්‍රකාශනය
උදා: රැක්මෙන දෙවියනේ වෙල බත් — බුදින්නේ
දුප්පත්කම නිසයි මම පැල් — රකින්නේ
(v) ලස්සන හිමවතේ මා වී — පැසෙන්නේ
දුක් දෙන අලි ඇතුන් පන්නා — හරින්නේ
රැක්මෙන දෙවියනේ වෙල බත් — බුදින්නේ
දුප්පත්කම නිසයි මම පැල් — රකින්නේ (ලකුණු 25)

**Answer**

# II කොටස

(3) (i) යොදුන් සියයක දුර සිටිය ද නැනණ්ඩිය තමාගේ බලයෙන් ගෙන්වා ගෙන ඈ තම භාර්යාව කර ගැනීමට හැකි වේවා! යන්න. (ලකුණු 05)

(ii) කෝපයට පත් ව පසේ බුදුන්ගේ පාත්‍රයේ තිබූ කැවුම් කොටස හැර ගත් නිසා (ලකුණු 05)

(iii) සාගල නුවරට ගොස් පබාවතී කුමරිය කැඳවා ගෙන එමි'යි සිතා. (ලකුණු 05)

(iv) රාජ්‍යය පියාණන්ට පවරා දීම් නම් ආපසු ගැන්ම අසීරු වෙතැයි සිතූ කුස කුමරු රාජ්‍යය තම මෑණියන්ට පවරා සාගල නුවරට යාම. (ලකුණු 10)

(ලකුණු 25)

**නැතහොත්**

(i) යහපත් සාරධර්ම සමාජයේ පැතිරවීම සඳහා අවශ්‍ය උපදේශ ලබාදීම. (ලකුණු 05)

(ii) සූර්යයා අපර පර්වතයෙන් උදාවූවත්, මහාමේරු පර්වතය සුළඟින් සෙලවෙතත්, ගින්න සිසිල් වුවත්, පර්වත මුදුනෙහි කුමුදු, මහනෙල් නෙලුම් මල් පිපෙතත්, (ලකුණු 05)

(iii) ගුණ නැණ බෙලෙන් යුතු පුතු ම ය. (ලකුණු 05)

(iv)
- මහත්මයන් කී වචනයෙහි බොරු නැත.
- සත් පුරුෂයෝ ලෝක සත්ත්වයාගේ සිතෙහි පවතින දුක දුරු කරති.
- ඉතා උතුම් වන්නේ ගුණ නැණ බෙලෙන් යුතු පුත්‍රයා ය.
- මහත් ගුණයෙන් යුත් මහත්මයනට පැමිණි විපත තැන්පත් නුවණින් යුතු උතුමෝ ම දුරලති.

(ලකුණු 10)

(ලකුණු 25)

# III කොටස

4, 5, 6, 7 ප්‍රශ්න සඳහා එක් ප්‍රශ්නයකට,

| | |
|---|---|
| නිදසුන් 03ක් සඳහා ලකුණු | 03 |
| සමස්ත විස්තරයට ලකුණු | 12 |
| මුළු ලකුණු | (15 x 2 = 30) |